
sinhalaebooks.com

N.D. අමාෂි තක්සලා.
N.D. සිතන මධුෂාන්

# දුටුගැමුණු රජතුමා



ලාල් ප්‍රේමනාත් ද මැල්

sinhalaebooks.com

# 1

කාවන්තිස්ස රජතුමාගේ වැඩිමහල් පුත් ගැමුණු කුමාරයා පොහොය දිනට පසුව එන බුධ දිනයෙහි උදය වරුවේ මාගම්පුර තිස්ස වෙහෙරට මෙහායින් පිහිටි ක්‍රීඩා පිටියේදී රණකෙළි ප්‍රදර්ශනයෙක යෙදෙන බව මාගම්පුර රාජ්‍යය පුරාම අණබෙරකරුවන් විසින් ප්‍රචාරය කරන ලදී.

එදා උදය වරුවේ මහ සමුද්‍ර ගොඩ ගමන් ගත්තා මෙන් මාගම්පුර අගනුවර කරා ගලා ආ මහා ජනතාව පාලනය කළ නොහැකි තරම් විශාල විය.

කාවන්තිස්ස රජතුමාට බෙහෙවින් අවශ්‍ය වී තිබුණේ තම රට වැසියන්ට තමන් සතු යුද බලය ප්‍රදර්ශනය කරන්නට ය. එයට හේතු වූයේ රජරටට විරුද්ධව ආක්‍රමණයක් මෙහෙයවීමට රජතුමා උත්සුක නොවන්නේ මන්ද? යන ප්‍රශ්නය බොහෝ රට වැසියන් තුළ රැව් පිළිරැව් දෙමින් පැවතීමයි. කාවන්තිස්ස රජතුමා

sinhalaebooks.com

බොහෝ දූරදර්ශී රජකු බව බුද්ධිමතුන්ගේ විශ්වාසය වුව ද දේශප්‍රේමයෙන් උමතු වූ සාමාන්‍ය තරුණයනට අවශ්‍ය වූයේ හැකි තරම් ඉක්මනින් රජරට ආක්‍රමණය කිරීමටය. ගැමුණු කුමාරයාගේ අදහස් උදහස් ද මෙයට වෙනස් නොවීය.

නගරයේ සෑම වීදියක්ම ඇත්, අස්, රිය, පාබල ආදී චතුරංග සේනාවන්ගෙන් පිරී තිබිණ. සැණකෙළියක් නරඹන්නට මෙන් මිනිස් ගඟ නගරය කරා ඇදුණේ මෙ බඳු අසාමාන්‍ය දර්ශනයක් නැරඹීමට අවස්ථාවක් ලැබෙන්නේ ඉතාම කලාතුරෙකින් නිසාය. නානා මාදිළියේ තූර්ය නාදයන්ගෙන් ද, සංගීතයෙන් ද මාගම්පුර අහස් කුස පිරී ගත්තේ ය.

මාගම්පුර රාජ්‍යයට අනුරාධපුර රාජ්‍යයට මෙන් දීර්ඝ කාලයක් තිස්සේ වඩා වර්ධනය වීමට කාලයක් නොතිබුණ ද කාවන්තිස්ස රජුගේ පාලන කාලය තුළ එය ශ්‍රී විභූතියෙන් අනුරාධපුර රාජ්‍ය පමණටම දියුණු තත්ත්වයෙක තිබිණ. තැනින් තැන විශාල ලෙස පැතිර ගිය මාගම්පුර රාජ්‍යය එක් කොනෙකින් කැලණිය දක්වා ද තවත් කොනෙකින් සේරු රාජ්‍ය දක්වා ද තවත් කොනෙකින් ත්‍රිකුණාමලය දක්වා ද පැතිර තිබිණි. ඒ ඒ ප්‍රදේශවල සිට මාගම්පුර



මහා වාසලට සේවය කළ ප්‍රතිරාජවරු, රාජ කුමාරවරු, තානාපතිවරු, ඈපාවරු, මාපාවරු, වන්නිනායකවරු, සේනානායකවරු ආදීහු කල් ඇතිවම ආරාධනා ලැබ පැමිණියාහු තමන්ට නියමිත ආසන සොයා ගොස් වාඩි ගත්හ.

කාවන්තිස්ස රජතුමාගේ පාලන සමය වන විට තිස්ස නගරය මාගම්පුර රාජ්‍යයේ ප්‍රධාන අගනුවර වූවා පමණක් නොව අනුරාධපුර නගරය පරාජයට පත් කරමින් දිවයිනේ වාණිජමය නගරය වශයෙන් ද ප්‍රධාන තැනක් ගෙන තිබිණි. ලෝකයේ නානා රටවලින් පැමිණි ව්‍යාපාරිකයෝ නගරයේ විවිධ තැන්වල සල්පිල් පැවැත් වූවෝ ය. නගරයේ ව්‍යාපාරික ස්ථානයන්හි දක්නට ලැබුණේ මෙරට නිෂ්පාදනවලට වඩා චීන, සියම්, බුරුම, ජාවා, රෝම, පර්සියා ආදී රටවලින් ආනයනය කරන ලද වෙළෙඳ භාණ්ඩයි. වෛවර්ණ මෝස්තර ඇඳුම් පැළඳුම්වලින් ද රෙදි පිළිවලින් ද වෙළඳ සැල් පිරී ඉතිරී තිබිණ.

එදා තිස්ස නගරයේ සෑම වීදියක්ම ධජ, පතාක ආදියෙන් සැරසී තිබිණි. කවර උත්සවයකින් වුව ද වැඩිපුර වාසි ලැබෙන්නේ ව්‍යාපාරිකයන්ටය. මහජනයා

sinhalaebooks.com



වැඩි වැඩියෙන් නගරය කරා ඇදී ඒම ගැන වාණිජ ව්‍යාපාරිකයෝ ඉමහත් සතුටට පත්වූහ. එපමණකුදු නොව වීදි සැරසිලි කිරීමට ඔවුන්ගෙන් ලැබුණු පිටුබලය කිව නොහැකි තරම්ය. ඔවුහු සිය කැමැත්තෙන් ම සැරසිලි කරන්නට ඉදිරිපත් වූහ. රාජ්‍ය සේවකයන්ටත් වඩා වෙළෙඳුන් මේ සැරසිලි ගැන උනන්දු වීම පුදුමයෙක් නොවීය.

පළමු වරට කුකුළා හැඬලූ මොහොතේ සිට ම පංච තූර්ය නාදය නො කඩවා ඇසෙන්නට විය. අනුරාධපුර රාජ්‍යය සොළීන් අතට පත්වීමෙන් පසු එහි සිටි බොහෝ සිංහල ධන සිටුවරු රජරට අතහැර මාගම් රාජ්‍යයට පදිංචියට පැමිණ සිටියහ. දේශප්‍රේමී සිංහලයෝ ද සොළී පාලනය ගැන කලකිරී මාගම් රාජ්‍යයට සංක්‍රමණය වූහ. මේ නිසා තිස්ස නගරය හා අවට ජනාකීර්ණ වෙමින් පැවතිණ.

මාගම් රාජ්‍යය සියලු නගරාංගයන් ගෙන් සම්පූර්ණ කිරීමට කාවන්තිස්ස රජතුමා දිවා රෑ වෙහෙස විය. එපමණකුදු නොව බෞද්ධ ජනතාවට වැඳුම් පිදුම් කිරීම පිණිස හැතැප්මෙන් හැතැප්මට වෙහෙර විහාර ඉදි කරන්නට ද කටයුතු යොදා තිබිණ. භික්ෂූන් වහන්සේලාට





අවශ්‍ය සෑම පහසුකමක්ම රජයෙන් සැලසුණේය. ජනතාවගේ සිත් ගැනීම සඳහා පමණක් නොව ගොවිතැන් කටයුතු වඩා වර්ධනය කිරීම පිණිසත්, වැව් අමුණු ඉදි කිරීමටත්, පරිපාලනයටත් නිලධරයන් යොදවන ලද්දේය. මෙය ගොවි ජනතාවට ආශිර්වාදයක් වූ බවට සැකයක් නැත.

කාවන්තිස්ස රජතුමා උපායශීලී දුර දක්නා නුවණින් යුත් ශූර රජ කෙනෙක් වූහ. ඔහු කැලණි රාජ්‍යය මාගම් රාජ්‍යයට යටත් කොට ගත්තේ සටන් කිරීමෙන් නොවේ. විහාරමහා දේවිය ආවාහ කොට ගෙන එහි නියම උරුමක්කාරයා බවට පත්වීමෙනි. වන්නිනායකවරුන් යටතේ පැවති වන්නි රාජ්‍යයන් ගණනාවක්ම තම අණසකට යටත් කොට ගත්තේ උපක්‍රමශීලී අන්දමිනි. තම සොහොයුරියගේ සැමියා සේරු නුවර පාලනය කළේය. සිය සොහොයුරියගේ නමින් සෝමාවතී නම් චෛත්‍යයක් කරවා එහි නිධන් කිරීම සඳහා මාගම්පුරයෙන් සර්වඥ ධාතූන් වහන්සේලා යවා කාවන්තිස්ස රජතුමා ද මේ උත්සවයට සහභාගි විය. උත්සවය සම්බන්ධයෙන් වන්නි රාජ්‍යයන් පුරා තොරතුරු ප්‍රචාරය කර තිබිණ. එහි සියලු රට වැසියෝම මේ උත්සවයට ඇදී

sinhalaebooks.com

ඇත. වන්නිනායකවරුන්ට ද සහභාගි නොවී සිටීමට නොහැකි විය. එහි රැස්වූ සියලුම වන්නිනායකවරු කාවන්තිස්ස රජුගේ උපක්‍රමශීලිත්වය නිසා ඔහුට යටත්ව ප්‍රදේශ පාලනය කරන්නට හිමිකම ගත්හ.

තමාගේ ජීවිත කාලය තුළදී අනුරාධපුර රාජ්‍යය ආක්‍රමණය කළ නොහැකි බැව් කාවන්තිස්ස රජු මැනවින් දැන සිටියේය. ඒ නිසාම අනුරාධපුර රාජ්‍යය හැරුණු කොට රටේ අනෙක් සියලුම ප්‍රදේශ මාගම් රාජ්‍යයට යටත් කොට මෙන රට එක්සත් කිරීම සඳහාත්, ජාතිය සමගි කිරීම සඳහාත්, රට වැසියා සුඛිත මුදිත කොට ඔවුන්ගේ සහයෝගය ලබා ගැනීම සඳහාත් අවශ්‍ය කටයුතු සංවිධානය කිරීමට ඔහු නොපසුබට වූයේය.

කාවන්තිස්ස රජතුමාගේ සියලු බලාපොරොත්තු මස්තකප්‍රාප්ත කිරීමට මෙන් ගැමුණු කුමාරයා යුද්ධ ශිල්පයෙහි නිපුණ රණශූර තරුණයෙකු විය. මුළු මහත් ශ්‍රී ලංකාවම එක්සේසත් කළ හැකි ශූර වීර බල පරාක්‍රමයෙන් යුත් මහා රණශූරයකු බව ඔහුගේ ක්‍රියා කලාපයෙන් ඔප්පු වී තිබුණේය.

කාවන්තිස්ස රජතුමාට විශේෂයෙන්ම අවශ්‍ය වී තිබුණේ තම ජ්‍යෙෂ්ඨ පුත්‍රයා වනම් ගැමුණු කුමාරයාගේ රණශූරත්වය මෑතක



මාගම් රාජ්‍යයට පැමිණ පදිංචිව සිටි ධන සිටුවරයන්ට ප්‍රදර්ශනය කරවීමටය. ඒ මතු ද නොව නුදුරු අනාගතයේ දී ඇතිවන මහා සංග්‍රාමයෙක දී සියලු රට වැසියාගේ සහයෝගය, අනුබලය හා අනුග්‍රහය තම පුත්‍රයාට ලබාදීම ද රජතුමාගේ අභිප්‍රාය වී තිබුණේය.

නියමිත වේලාව ළංවී තිබිණ. තිස්ස විහාරයට මොබින් වූ ක්‍රීඩාංගනයට ඇතුළු වන්නට හෝ එයින් පිට වන්නට හෝ කිසිවකුට නුපුළුවන් තරමට එය ජනයාගෙන් පිරී ඉතිරී ගොස් තිබිණ.

කාවන්තිස්ස රජතුමා ද එම බිසොව ද, අගමැති හා දස මහා යෝධයෝ ද විශේෂයෙන් ඉදිකොට තැබූ මංගල මණ්ඩපයෙහි අසුන් ගත්හ. පුන් කලසින් සරසා අසෙනිය මල් ඉසින ලද මණ්ඩපය ඉදිරියේ මුල් අසුන් පෙළ හොබවන ලද්දේ සානාපතිවරුන් විසිනි. ඇපාවරු, මාපාවරු, වන්නිනායකවරු ඊළඟට අසුන් ගෙන සිටියහ. අනුරාධපුර රාජ්‍යයෙන් සංක්‍රමණය වූ නව ප්‍රභූන් ද, ප්‍රාදේශීය ප්‍රභූන් ද පිළිවෙළින් අසුන් හොබවමින් සිටියහ.

මුලින්ම ගැමුණු කුමාරයා සෛන්ධව අශ්වයකු පිට නැග අසු විහිදුවාලීය. ඇසිපිය හෙළන පමණින් ඔහු අසු විහිදුවා මිනිත්තු

ගණනෙකින් තිස්ස නගරය පුරා කරක් ගසා ඒ පැමිණි වේගයෙන් මණ්ඩපය ඉදිරියෙහි නැවතී, එහි වූ වෙනත් අසකු පිටට පැන්නේය. අසුරු සැණින් අසු විහිදුවා යළිත් තිස්ස නගරය පුරා කරක් ගසා මංගල මණ්ඩපය ඉදිරියට පැමිණ අසු නතර කොට, එහි නතර කොට තිබූ මැතකදී ග්‍රීසියේ සිට ගෙන්වන ලද දූවැන්ත අසකු පිටට නැඟී ඒ අසු ද වේගයෙන් විහිදුවාලීය. රැස්ව සිටි ජනයා වැල නොකැඩී අත්පොළසන් දෙන්නට පටන් ගත්හ.

මංගල මණ්ඩපය පසෙකින් රූකඩයක් ඉදි කොට තිබිණ. මේ රූකඩය අතෙහි අඹ ගෙඩියක් විය. රූකඩයට කිසිදු හානියක් නොවන ලෙස අඹ ගෙඩියට හීයෙන් විද එය බිම දැමීමට නියම විය. ගැමුණු කුමාරයා නියම ධනුර්ධරයකු මෙන් දුනු - හී ද ගෙන නියම ස්ථානයට ගියේය. සිය දකුණු කකුල පස්සට තබා, වමතින් මුඩාව තරයේ ගෙන හීය මුදා හැරියේය. ඊතලය විදුලියක වේගයෙන් ගොස් අඹ ගෙඩිය නටුවෙන් බිම හෙළීය. ජයඝෝෂාව කන්ගොබ බිහිරි කරවන්නට තරම් විය.

මේ වකවානුව වන විට ගැමුණු කුමරුට යන්තම් සොළොස් විය පිරුණා පමණි. රැස්ව සිටි ප්‍රභූන්ගේ මෙන්ම සාමාන්‍ය මහජනයාගේද





එකම විශ්වාසය වූයේ නුදුරු අනාගතයේ දී මෙ රණකාමී, සංග්‍රාම ශූර තරුණ කුමාරයා තුන් සිංහලයම එක් කොට, එක් ධජයක් යටතට පත් කිරීමට සාකල්‍යයෙන්ම සමත්වන බවය. කඩු සරඹ, දුනු සරඹ, හස්ති ශිල්පය, අශ්ව ශිල්පය ආදී ක්ෂත්‍රිය ශිල්පයන්හි හේ පාරප්‍රාප්ත වී සිටියේය. ශිල්ප ප්‍රදර්ශනයෙන් පසු තම දෙමවුපියන්ගේ දෙපා නැමැද, පැමිණ සිටි සියලුම ජන කොටස්වලට ආචාර කොට කුමරු තමාට නියමිත අසුනෙහි වාඩි ගත්තේය.

පස්වරුවේ දස මහා යෝධයන්ගේ ශිල්ප ප්‍රදර්ශනය පැවැත්වෙන තෙක් පෙරවරු උත්සවයේ කටයුතු හමාර විය.

## 2

මාගම් රාජ්‍යය පුරා අස්සක් මුල්ලක් නැර කුඹුරු අස්වැද්දීම නිසා රාජ්‍යයම සිරිසාර කෙතක් බවට පත්වී තිබිණ. කාවන්තිස්ස රජතුමාගේ මූඛ්‍ය පරමාර්ථය වූයේ රට මුළුමනින්ම ස්වයංපෝෂිත කිරීමත්, ගොවිතැන් කරන ගැමියන්ගේ තත්ත්වය නගා සිටුවීමත්ය. ගොවීන් ධෛර්යවත් කිරීම සඳහා ඔහු නානාවිධ උපක්‍රම යෙදීය.

ඒ අස්වැන්න නෙළා ගැනීමේ වකවානුව වූ හෙයින් මුළු මාගම් පුරයම කවරදාවත් නොපැවති අන්දමේ කඩිසර බවෙකින් යුක්ත විය. සෑම කෙනෙක්ම කවර හෝ ගොවිතැන් වැඩක යෙදී සිටියේ ය. වැඩක් නැති මිනිහෙක් සොයාගැනීම කළුනික සෙවීම මෙන් දුෂ්කර විය.

අස්වැන්න කැපීමේ උත්සව හැම තැනකම දක්නා ලද හෙයින් මාගම් රාජ්‍යය පුරා අමුතු උත්සවශ්‍රීයක් උද්වහනය කළේය. තැනින් තැන ගොයම් නෙළන ගෙවිලියන් ගයන කන්කලු ගීයෙන් හාත්පස ප්‍රදේශයම සංගීතවත් විය. සිහින් සරෙන් හඬන සුළඟ ගී හඬ ඈතට ගෙන යන්නට උත්සාහ කළේය.

වැඩ කරන්නා හා කරවන්නා යන භේදයක් දක්නට නොතිබිණ. හැමෝම එකාවන්ව වැඩ කළහ. කුඹුරු හිමියා අනෙක් අයට වඩා මහන්සියෙන් වැඩ කළේය. එය කාර්යක්ෂමතාව දියුණු කිරීමට හේතුවෙක් විය.

කුඹුරු අසලම වූ කමතෙහි ගොයම් රැස් කැර තැබිණි. වරින්වර වැඩෙහි අනලස්ව යෙදී සිටි යුවතියන්ගෙන් ඇසුණු ගීපද රාවය මෙන්ම, කැකිරි පළන හිනා හඬ ද අසන්නන්ටත්, දකින්නන්ටත් විනෝදයක් ගෙන දුන්නේය.

මහ රජතුමාගේ මෙහෙයැවීමෙන් ගැමුණු කුමාරයාත්, මැති ඇමතිවරුත් රට පුරා වූ මෙබඳු අස්වැන්න කපා නෙළා ගැනීමේ උත්සවවලට සහභාගි වූහ.

එයිනික්බිති අලුත් සහල් මංගල්‍යය ද දකින්නන්ට නේත්‍ර රසාංජනයක් බඳු කෙළි සෙල්ලමින් පිරීගත් සමයක් විය.

කාවන්තිස්ස රජුගේ (කලින්) බිසොවකගේ පුතකු වූ දීඝාභය දීගාමඩුල්ල ප්‍රදේශය තිල් ගොයමින් පිරීගත් එකම වෙල්යායක් බවට පත් කරමින් දිවා රෑ නොබලා වෙහෙස විය. මුළු

රටටම අවශ්‍ය ආහාර පාන දිගාමඩුල්ලෙන් සැපයීමේ ගෞරවය ලබා ගන්නට හෙතෙම ගොවීන් උසි ගැන්විය.

මාගම්පුරයේ මෙන්ම දිගාමඩුල්ලේ ද අස්වැන්න නෙළීමේ උත්සවය එකම වකවානුවකට යොදාගෙන තිබිණ. කාවන්තිස්ස රජු වෙනුවෙන් තිස්ස කුමරු දිගාමඩුල්ලට ගොස් මේ උත්සවයන්හි ප්‍රධාන අමුත්තා බවට පත් විය. දීඝාභය කුමරු තම බාල සොහොයුරු තිස්සට බෙහෙවින් ඇලුම් කළේය. කලක් තමන් හා මාස ගණනාවක් විසූ ගැමුණු නහයට නහන හිතුවක්කාරයකු වූ හෙයින් ඔහුට විරුද්ධව කාවන්තිස්ස රජුට පැමිණිලි කරන්නට ද දීඝාභය කුමරුට සිද්ධ විය. කාවන්තිස්ස රජු කළේ වහාම ගැමුණු කුමරු මාගමට ගෙන්වා ගැනීමය. දීඝාභය, තිස්සට මොන තරම් ප්‍රියමනාප වූයේ ද යත් ඔහු දිගාමඩුල්ලේම නතර කරවා ගැනීමට ද ආශා කළේය. පසුව කාවන්තිස්ස රජුගේ ද අනුමැතිය ඇතිව තිස්ස කුමරු දිගාමඩුල්ලේ යුවරාජ තනතුරට ද පත්විය.

මහවැලි ගඟ ඉහළ අමුණු බැඳ වතුර හරවා වැව් පුරවා බලවත් පරිත්‍යාගයකින් යුක්තව දීඝාභය කරන ව්‍යාපාරය දෙස නිරීක්ෂණය කළ තිස්සගේ සිත දේශ භක්තියෙන් පිරී ඉතිරී ගියේය. මගේ රට, ලෝකයේ උසස්ම රට, කිසි රටකට නො දෙවැනි රට බවට පත් කරමැයි





යන අධිෂ්ඨානය තරුණ තිස්සගේ සිතෙහි පැලපදියත් විය.

දීඝාභය කුමරු තම බාල සොහොයුරු තිස්සට තමා වාසය කළ කුඩා මන්දිරය පවරා ඔහු සැතපුම් කිහිපයකට එහායින් නව නිවසක් ඉදි කරන්නට ආරම්භ කළේ ය.

"ඇයි අයියා, අපි දෙදෙනාටම මෙය හොඳටම ඇති නේද?"

"මල්ලී, ගොවිතැන් බත් කිරීමේ වගකීමෙන් බාගයක් ඔබ බාරගන්නට ඕනෑ. කසාතොට දෙපැත්තේම මුර පොළවල් තියනවා. අනුරාධපුරයට යන අය මෙන්ම මාගමට යන අය ද කසාතොට පසුකරලයි යන්නට තියෙන්නේ. දැනට එහි සිටින්නේ අපේ සෙබළුන් සියයකට වැඩි නොවන ගණනෙක්. එතැන ආරක්ෂක කඳවුරු තවත් තර කරන්නට ඕනෑ. මා කල්පනා කළේ මා කසාතොට පදිංචි වුවහොත් අපේ අනාගත වැඩ පිළිවෙළ වඩාත් හොඳින් කරන්නට පුළුවන් බවයි."

"හොඳයි අයියා, ඔබේ වැඩ කොටස මම කරන්නම්. ඔබ නිතරම පැමිණ මට කළ නොකළ යුතු දේ කියා දෙන්නට ඕනෑ."

"මගේ රත්තරන් මල්ලී, ඔබ ඒ ගැන කිසිම සැකයක් ඇති කර ගන්නට එපා. ඔබේ ආරක්ෂාවට සෑහෙන සෙබළ පිරිසක් මේ වටා

sinhalaebooks.com

සිටිනවා. මම නිතරම පැමිණ මල්ලිගේ දුක සැප සොයා බලන්නම්."

රට එක්සත් කිරීමේ දේශප්‍රේමී සටනේ දී තම සොහොයුරු දීඝාභයගෙන් සිදු වී තිබෙන සේවය විශාල බවත්, තමාත් දිවා රෑ වෙහෙස වී ඒ සේවය නොකඩවා කරගෙන යා යුතු බවත් තිස්ස තදින්ම සිතට ගත්තේ ය.

දීඝාභය කුමරු අලුතින් ඉදි කළ නිවාසය කසාතොට දේශසීමාව අසල කඳු ගැටයක් මත පිහිටියේය. වරින්වර එහි ගොස් තිස්ස ද සොහොයුරා සමඟ දිනක් දෙකක් ගත කිරීම සිරිතක් කොට ගත්තේය. අවට තැනින් තැන අට්ටාලයන් මත සෙබළුන් වාසය කළ නිවහන් ඉදිකොට තිබිණ. දීඝාභය හා තිස්ස මේ එක් එක් අට්ටාලයන් කරා ගොස් සෙබළුන්ගේ සැප දුක් සොයා බැලීම ද සිරිතක් කොටගත්තේය. "මේක අපේ රට දරුවා, අප මළත් අපේ රට රැකගන්න ඕනෑ. අප එක්සත් හෙළයක් හදන්නටයි මේ තරම් දුක් විඳින්නේ. අපට බැරි වුණොත් අපේ දරු මුණුබුරන් හරි එහි ප්‍රයෝජන ගනීවි. ඒ නිසා මොන තරම් දුක් කරදර විඳගෙන හරි රාජකාරිය හරියට කරන්නට ඕනෑ." දීඝාභය එක් එක් තරුණ භටයකුගේ පිටට තට්ටු කරමින් නොඑසේ නම් ඔහුගේ අත ගෙන තම අතින් තද කරගනිමින් තරුණ සෙබළුන් උනන්දු කරවන අන්දම තිස්ස ආසාවෙන් බලා සිටියේය.



# 3

ගැමුණු කුමරු උන්හිටි හැටියේම මාගම රාජ්‍යයෙන් අතුරුදහන්වීම නුවරුන්ගේ නොයෙක් කට කතාවලට හේතු විය. එහෙත් මැති ඇමතිවරුන් ඇතුළු ඉහළ පෙළේ නිලධරයන්ට ද, දස මහා යෝධයනට ද මේ සිද්ධිය රහසක් නොවීය.

ප්‍රතාපවත් කාවන්තිස්ස රජුගේ මුහුණ වෙනදා මෙන් නොව ශෝකයෙන් පිරී තිබිණ. ඔහුගේ උදාර, එමෙන් ම අභීත මුහුණ වෙනස් වූයේ මන්ද යනු ඇමැතිවරු දූන සිටියහ.

"මේ කම්පා විය යුතු දෙයක් නොවෙයි මහ රජතුමනි." මහ ඇමති රජුගේ මුහුණ දෙස බලමින් සෙමින් කීය.

"කම්පා විය යුතු දෙයක් නොවන බව ඇත්ත. එහෙත් ගැමුණු මට ගැහැනු ඇඳුම් කට්ටලයක් එවීමෙන් අදහස් කරන්නේ මා ගැහැනියක බවයි. ඒක ලජ්ජා විය යුතු කාරණයක්." රජතුමා මාළිගයේ වහල දෙස බලාගෙන කල්පනා කරන්නට විය.

sinhalaebooks.com



"ඔබ වහන්සේට ලජ්ජාවට කිසිම හේතුවක් නැහැ. ගැමුණු කුමාරයාට තවම අනුරාධපුර රාජ්‍යයේ සැබෑ තත්ත්වය තේරුම් ගන්නට බැහැ. තවම අනුරාධපුර රාජ්‍යයට විරුද්ධව සටන් වදින්න තත්ත්වයක් නැති බව ඔබ වහන්සේට පැහැදිලි වුණාට ඒ ළාබාල කුමාරයාට අවබෝධ කරගන්නට බැහැ. ඔබ වහන්සේගේ දුර දක්නා නුවණ අපි දනිමු. ඒ නිසාම ගැමුණු කුමාරයාට අනුරාධපුර රාජ්‍යයට විරුද්ධව සටනට යාමට අවසර නොදීම සාධාරණ තීන්දුවක්."

අග සෙනෙවි ද රජු අස්වසාලීමට ඉදිරිපත් විය.

"මට කැලලක් නොවූ බව ඇත්ත. ඒත් ලජ්ජාවට හේතුවක් නැහැයි කියන්නට බෑ."

රජුගේ මුහුණෙහි වූ ගම්භීර පෙනුම වෙනුවට ඇත්තේ සියල්ලෙහි කලකිරුණු ස්වභාවයෙකි.

"ඔබ වහන්සේගේ දූරදර්ශී රාජ්‍ය පාලනය රට වැසියාට රහසක් නෙවි. එමෙන්ම සියලු රට වැසියෝ තමන්ගේ ජීවිතයට වඩා ඔබ වහන්සේගේ ජීවිතයට ආදරය කරති. එහෙම තියෙද්දී ගැමුණු කුමාරයා ස්ත්‍රී ආභරණ කට්ටලයක් ඔබ වහන්සේ වෙත එවූ පළියට එයින්





වෙන නිග්‍රහය කුමාරයාට මිස ඔබ වහන්සේට නොවේ, ස්වාමීනි" අගමැති නැවතත් රජතුමාගේ මුහුණ බලමින් කතා කළේ අවංක හැඟීමෙන් යුතු ව බව රජතුමා තේරුම් ගන්නට ඇත.

"ගැමුණුගේ වැඩ ගැන දේවියත් වග කියන්නට ඕනෑ!"

අග සෙනෙවි රජු අස්වසන පිණිස කී නමුත් රජතුමා කී පරිදි ගැමුණු කුමාරයාගේ මේ සාහසික ක්‍රියාව දේවින් වහන්සේ දැන සිටින්නට ඇති බවට සාධාරණ සැකයෙක් ඔහුගේ සිත තුළ ද රජයමින් තිබිණ.

"ගැමුණුට කොයින් ද අග සෙනෙවි ස්ත්‍රී ආභරණ? ඒවා දේවියගෙන් ලබාගන්නට ඇති. ඇරත් ඔය වගේ හිතුවක්කාර වැඩක් කළේ ඇයි?"

වෙනදා තේජාන්විත භාවයෙන් පිරී ඉතිරී ගිය රජතුමාගේ මුහුණෙහි අද දක්නට ඇත්තේ අහිංසක දරුවකුගේ වැනි පෙනුමක් බව අග සෙනෙවි දුටුවේය. රජතුමාගේ හදවත බලවත් ලෙස කම්පනය වී ඇත්තේ පුතාගේ දරදඬු ක්‍රියාවට පමණක් නොවන බව ඔහු ප්‍රත්‍යක්ෂ කර ගත්තේ ය.

"කුමාරයා මාගමින් පැන ගිය බවට සැකයක් නෑ, මහ රජතුමෙනි" අගමැති තොල් මැතිරීය.

"ඔහු මාගමින් පැන ගිය බවද තොප දන්නේ?"

"එහෙමයි දේවයන් වහන්ස."

"ඔහු කොත්මලය බලා ගිය බව මට ආරංචියි." ඒ රජතුමාය.

"කොත්මලය? එහෙනම් අපට ඔහු සිර අඩස්සියට ගත හැකියි."

"මොකක්ද එයින් ඇතිවන ප්‍රයෝජනය? ඔහුට අනවශ්‍ය ප්‍රසිද්ධියක් ලබා දීම පමණයි."

"කුමාරයාට අවශ්‍ය වී තිබෙන්නේ එයයි."

"අන්න හරි, අග සෙනෙවි, මේ එයාගේ හිතුවක්කාර වැඩක් නෙවෙයි කියලා මා හිතන්නේ ඒ නිසයි."

රජුගේ මුහුණෙහි මන්දාලෝකයක් පහළ වූයේ ඔහුගේ තර්ක බුද්ධිය අග සෙනෙවි විසින් තේරුම් ගන්නා ලද හෙයිනි.

"ඔබ වහන්සේ සැහෙන වෙහෙසට පත් වෙලා. ටික වේලාවක් සැතපුණොත් හොඳයි කියලා හිතනවා" අගමැති කීය.

"ඇත්ත මට හොඳටම වෙහෙසයි. මුළු රැයම නිදි නැතිවයි හිටියේ."

"අග සෙනෙවි, අගමැති ඔබ දෙපළට බාරයි රට ආරක්ෂා කිරීම. සාමය! සාමය! ඒ තමා වැදගත් දෙය."

"හොඳමයි මහ රජතුමනි, ඔබ වහන්සේ ටික වේලාවක් සැතපී විවේක ගත මැනවි."





ගැමුණු කුමාරයා මාගම් පුරයෙන් පලා යෑමෙන් පසු කාවන්තිස්ස රජුගේ මානසික තත්ත්වය ඉතාම දුර්වල විය. තමා රට වැසියන් අතර බියගුල්ලෙකැයි යන හැඟීමක් පැතිර ඇතැයි රජතුමා විශ්වාස කෙළේය. ඔහු අස්වැසීම සඳහා ඇමැතිවරුන් ගත් උත්සාහයෙන් ද එතරම් පලක් නොවිය. තම කීර්ති නාමයට කැළලක් විණැයි යන විශ්වාසය ඔහු කෙරෙන් තුරන් කිරීමට කිසිවෙක් සමත් නොවීය. දිනෙන් දිනම රජතුමා සොවබර තත්ත්වයෙන් පිරිහෙන්නට පටන් ගත්තේ ය.

ගැමුණු කුමාරයා කොත්මලේ පසු වදුලන නවාතැන් ගෙන තිබෙන බවත්, නිතරම පාහේ මාගම්පුර සිට ඔහු බැහැදැකීමට නන්දිමිත්‍ර, වේළුසුමන ආදී යෝධයන් පැමිණෙන බවත් චරපුරුෂයන් මාර්ගයෙන් රජතුමාට දැනගන්නට ලැබීමෙන් ඔහුගේ සිත් වේදනාව දෙගුණ තෙගුණ විය. මේ සියල්ලක්ම කෙරෙන්නේ විහාරමහා දේවියගේ අනුදැනීමෙන් බව රජතුමා තුළ පැවති විශ්වාසය වඩාත් තහවුරු වූයේ මෙයින් පසුවය.

හෙතෙම බොහෝ විට මාලිගාවේ ඒ මේ අත සෙමින් පා තබා ගමන් කරමින් අනාගතය ගැන කල්පනා කෙළේය. ඇතැම් විටෙක "දුෂ්ට ගාමිණී, දුෂ්ට ගාමිණී" "දුටුගැමුණු, දුටුගැමුණු" යන වචන සෙමින් තොල් මතුරනු ද ඇසිණ. තමා සැලසුම් කළ අනාගත වැඩ පිළිවෙළ

සුළඟට අසු වූ කඩදාසි ඉරුවක් මෙන් විනාශ වී යතැයි රජුගේ සිතට නැගෙත්ම හදවත පුපුරු ගසන්නට විය. වයෝවෘද්ධ රජතුමා දරාගත නොහැකි වේදනාවෙන් සමහර විටෙක කෙඳිරි ගාන්නට ද විය.

රජතුමා හදිසියේම ඔත්පළ විය. රාජ වෛද්‍යවරයා විසින් දිවා රෑ වෙහෙසෙමින් නානාවිධ ප්‍රතිකාර කළ නමුත් ඔහුගේ වේදනාව සුවපත් කළ නොහැකි වූයේය. විහාරමහා දේවිය ද ඇසිපිය නොහෙළා දිවා රෑ රජුගේ සයනය අසලට වී කළ යුතු සියලුම සාත්තු සප්පායම් නොපිරිහෙළා ඉටු කළාය.

දිගාමඩුල්ලේ සිටි තිස්ස කුමාරයාට පියාණන්ගේ රෝගී තත්ත්වය දැන ගන්නට ලැබී වහා මාගමට පැමිණියේය. හේ පියාණන් වෙනුවෙන් වෙහෙස නො බලා උවටැන් කළේය. කොත්මලේ සිටි ගැමුණු කුමරුට මේ බව දන්වනු පිණිස ගිය යුද සෙනෙවියන් දෙදෙනකු ම ආපසු පැමිණියේ ගැමුණු කුමරු තම මෑණියන්ගේ නෑදෑයින් සොයා කැලණිය බලා ගොස් සිටි බැවිනි. ගැමුණු කුමරු කොත්මලේ ගත කළ කාලය තුළ එක් මොහොතක් හෝ අපතේ නො හරින්නට මහන්සි ගත්තේය. එතෙක් මාගමට අවනත නොවූ ප්‍රාදේශීය නායකයන් සොයමින් සොළීන්ට විරුද්ධව කරන සටන සඳහා ඔවුන්ගේ සහයෝගය ලබාගන්නටය.





කැලණි රාජ්‍යයේ සිටි තම මෑණියන්ගේ නෑදෑයන්ගේ පූර්ණ සහයෝගය වහාත් අවශ්‍ය වූයේ මාගමට අවනතව කැලණි රාජ්‍යයේ එක්සත් බව තහවුරු කරගැනීම පිණිසය. ගැමුණු කුමරුගේ මේ ව්‍යායාමය මල්පල ගැන්වුණේ එක්සත් හෙළයක් බිහි කිරීමට සෑම රාජ්‍ය නායකයකු ම එකඟත්වයට පැමිණි හෙයිනි. කැලණියේ සිටි නාග ගෝත්‍රිකයෝ භක්තිමත් බෞද්ධයෝ වූහ. සොළීන්ට විරුද්ධව කැලණියෙන් යුද්ධ සේනා රැස් කරගැනීම එහෙයින් එතරම් අපහසු නොවීය. මේ සටනේ නායකත්වය තම ගෝත්‍රයට අයත් විහාරමහා දේවියගේ පුතකු විසින් ගෙන සිටීම ගැන ඔවුහු වහාත් සතුටු වූහ. සියලු අතින් බලන කල ගැමුණු කුමරුගේ දූත මෙහෙවර සම්පූර්ණයෙන් ම සාර්ථක විය. මේ නිසා හෙතෙම බලවත් ප්‍රීතියට පත් වූයේය.

තමා විසින් පියාණන්ට කළ නිග්‍රහය ගැන ගැමුණු කුමරු ද සිතින් පීඩා වින්දේය. තම පිය රජු දූරදර්ශී පාලකයෙකු බව ද රට වැසියන් ඔහු කෙරෙහි දක්වන පක්ෂපාතීත්වයද එයට හේතු වූ කරුණු ද සිහියට නැගෙත්ම ඔහුගේ සිත ශෝකයෙන් පුපුරු ගසන්නට විය. තම පියාණන් අනුගමනය කිරීමෙන් මිස වෙනත් ක්‍රමයකින් රට වැසියන් අවනත කර ගත නොහැකි බවද ගැමුණු කුමරු අවබෝධ

sinhalaebooks.com



කැරගෙන තිබිණ. පිය රජුට කළ නිග්‍රහය නිසා රට වැසියන් තමා කෙරෙහි කලකිරී ඇතැයි යන සහේතුක බියක් ද ඔහු තුළ පැවතිණ. ඒ සියල්ලටමත් වඩා තමාට ඒසා ආදරය කළ පියාණන්දෑ රට වැසියන් හමුවේ නින්දාවට පාත්‍ර කිරීමෙන් තමා කළ වරදට ඔහුට ඔහුගේ හදවතින් කිසිසේත් සමාව දුන්නේ නැත.

කාවන්තිස්ස රජුගේ අභාවය පිළිබඳ ප්‍රවෘත්තිය මාගම්පුර වැසියනට දැන ගන්නට ලැබුණේ හදිසියේ පාත් වූ හෙණ ගෙඩියක් මෙනි. සාමාන්‍ය රට වැසියෝ හැම කෙනෙක්ම පාහේ සිය ආදරණීය පියාණන් මළ කලෙක මෙන් හඬා වැලපෙන්නට වූහ. මේ ප්‍රවෘත්තිය ප්‍රභූන් අතර ද ඇති කළේ බලවත් කම්පනයකි. මීළඟට කිමෙකින් කිමෙක් සිදුවේද? යන්න ඔවුනට අවබෝධ කරගත නොහැකි විය. මිනිසුන් දසදහස් ගණනින් රජ මැදුර වටා රැස් වී ඔවුනොවුන් අතර වචනයක් පවා හුවමාරු කර නොගෙන වැලපෙමින් සිටිනු දක්නා ලදී.

ගැමුණු කුමරු සොයා කොත්මලයට ගිය රාජ දූතයන් ආපසු පැමිණියේ ඔහු ආ ගිය තැන් පිළිබඳ කිසිදු තොරතුරක් දැනගන්නට නොහැකි වූ බව දන්වමිනි. විහාරමහා දේවිය හා තිස්ස කුමරු සමඟ කතිකා කරගත් ඇමතිවරු හා සෙන්පතිවරු රජතුමාගේ අන්තිම ඉල්ලීම පරිදි කිසිම රට වැසියකුට හිරිහැරයක් නොවන පරිද්දෙන් ආදාහන කටයුතු ඉතාම





චාම් අන්දමින් සිදු කළහ. එදින මාගම එකම ගෙදරෙක හෝ ළිප ගිනි නොතැබූ බව දනන් තුඩග රැව් පිළිරැව් දෙන්නට විය.

මීළඟට කුමක් කළ යුතු ද? යන්න ගැන සාකච්ඡා කිරීමට රාජ සභාව වහා රැස්විය. ගැමුණු කුමරු කෙරෙහි රට වැසියන් තුළ පවත්නා අවනතභාවය තේරුම් ගත් ඇමතිවරු ගැමුණු කුමරු සතියක් තුළ කොතැනෙකින් හෝ සොයා ගෙන විත් ඔටුනු පැළඳවීමට තීරණය කළහ.

ගැමුණු කුමරු ගැන සොයා බැලීමේ යෙදී සිටි රාජ දූතයන් ඔහු කොත්මලයට පැමිණ සිටින බැව් ඇමති මණ්ඩලයට දන්වා තිබිණ. ඇමතිවරු ගැමුණු කුමාරයා පිළිගැනීම සඳහා මංගල හස්ති රාජයකු ද පෙරටු කොටගෙන විශාල පෙරහැරක් කොත්මලය කරා පිටත් වූයේ රට අරාජික තත්ත්වයෙක පැවතීම සතුරනට කදිම අවස්ථාවක් විය හැකි බැවිනි. ඇමතිවරුන් සහිත පෙරහැර කොත්මලයට ළඟා වූයේ ඇසළ පුර පසළොස්වක දිනය. එදින ගැමුණු කුමාරයා කොත්මලය රජ මහා විහාරයට ගොස් පෙහෙවස් සමාදන්ව බෝ මළුව අසල සිහිල් සෙවණෙහි හිඳ භාවනා කරමින් සිටියේය. විහාරය කරා එන පංච තූර්ය නාදය සහිත පෙරහැර බලනු වස් එහි රැස්ව සිටි උවැසු උවැසියෝ මඟ දෙපස රැස්වනු දුටු නමුත් ගැමුණු කුමාරයා මඳකුදු

sinhalaebooks.com



නොසෙල්වී භාවනාවෙහි යෙදී සිටියේය. නොබෝ වේලාවකින් පෙරහැර විහාරය කරා පැමිණි අතර මංගල හස්ති රාජයා ගැමුණු කුමරු අබියසට පැමිණ දෙ දණ බිම ඇන ගෞරව සම්ප්‍රයුක්තව ඔහුගේ මුහුණ මොහොතක් බලා සිටියේය. ඒ වන තෙක් තම පියාණන්ගේ හදිසි අභාවය පිළිබඳ කිසිදු තොරතුරක් ගැමුණු කුමරු දැන නොසිටි හෙයින් ඇමතිවරු හඬා වැලප සියලු තොරතුරු ඔහුට දන්වා වහාම මාගමට පැමිණ රාජ්‍ය භාරගන්නා ලෙස ඉල්ලා සිටියහ. ගැමුණු කුමරු කිසිසේත් බලාපොරොත්තු නොවූ මේ දුක්ඛදායක ආරංචියෙන් ඔහුගේ සිත වාවාගත නොහැකි විය. චිත්ත පීඩාව අධික වූ හෙයින් සිහි එළවාගත නොහී ගල්ගැසී සිට ඉක්බිති මහ හඬින් වැලපෙන්නට විය. ඇමතිවරුන්ගේ සැනසිලි බසින් හා ඔහු පිට පැවරී තිබෙන වගකීම් භාරය අවබෝධ කර දීමෙන් පසු ගැමුණු කුමාරයා ඇතු පිටට නැංගේ ය.

මෙතෙක් කල් ගැමුණු කුමරු පිළිබඳ හාංකවිසියක් හෝ නොදැන සිටි ගැමියෝ බියෙන් ද, ත්‍රාසයෙන් ද අන්දුන් කුන්දුන් ව කළ යුත්තේ කිමෙක්දැයි නො දැන වැඳ වැටුණහ. භික්ෂූන් වහන්සේලාගේ සෙත් පිරිත් සජ්ඣායනයෙන් පසු ගැමුණු කුමරු පෙරටු කොට ගත් රජ පෙරහැර ආපසු මාගම බලා පිටත් විය.



## 4

තම මලණුවන් විසින් මෑණියන් හා කඩොලැතා ගෙන දිගාමඬුල්ලට යෑම ගැමුණු රජුගේ ශෝකයට හේතු විය. වහාම මෑණියන් හා කඩොලැතා එවන්නැයි මලණුවනට පණිවුඩ යැවූ නමුත් තිස්ස කුමරු ඒ ගැන කිසිදු තැකීමක් නො කළේය. නැවත නැවතත් පණිවුඩ යැවූ විට හැකි නම් (සටන් කොට) ලබා ගනුව'යි තිස්ස කුමරු දූතයින් මගින් හසුන්පත් එවීය.

මලණුවන්ගේ පිළිතුරෙන් කෝපයට පත් ගැමුණු රජු 'එසේ නම් සටනට එව'යි දූතයන් මගින් දන්වා ගැමුණු රජු කුඩා හමුදාවක් සමඟ මලණුවන්ට මුහුණ දෙන්නට පෙරමඟට ගියේය. දස මහා යෝධයෝ ද නායක සෙනෙවිවරු ද කිසිදු පක්ෂයන් නොගෙන නිහඬ වූහ. කාවන්තිස්ස රජතුමා ජීවත්ව සිටියදී දෙසොහොයුරන් අතර සටනක් සිදුවුවහොත් කිසිදු පක්ෂයන් නොගන්නා

sinhalaebooks.com



හැටියට සෙනෙවිවරුන්ගෙන් ගිවිසුම් ගෙන තිබිණ. "කවර දා හෝ රාජ්‍යය සඳහා දෙසොහොයුරන් අතර සටනක් වෙතැයි" රජු තුළ පැවති විශ්වාසය ගැන දස මහ යෝධයෝද කතා බහ කළහ.

"අපේ රජතුමා දූරදර්ශී උතුමෙක්. එතුමා මියයෑම අනුරාධපුර සටනට ලොකුම පාඩුවක්." නන්දිමිත්‍ර කීය.

"මහ රජතුමා අනුරාධපුර සටනට සූදානම් වූවත් ඒ ගැන හාංකවිසියක් දැනගන්නට තිබ්බේ නෑ. අයියට මතක ද සේරු රාජ්‍යයත්, වන්නි රජවරුත් යටත් කරගත් හැටි" සුරනිමල නන්දිමිත්‍රගෙන් ඇසීය.

"කොහොමද ඕව අපට අමතක වෙන්නේ? කැලණිය අතට ගන්න ඕනෑ නිසා තමයි විහාරමහා දේවිය විවාහ කර ගත්තෙත්?" වයසින් වැඩිමහලු වේළුසුමන අතීතය ගැන කතා කළේ මේ ප්‍රවෘත්තිය තම වැඩිහිටියන්ගෙන් අසා තිබුණ නිසාය. "මුළු මාගම් පුරයම කතා කරන්නේ මහ රජතුමාගේ නුවණ ගැන! ආයෙත් රට එක්සත් කරන්නෙ කොහොමද කියලයි මා කල්පනා කරන්නේ?" ථේරපුත්තාභය කීය. "ඇයි රට වැසියන්ගේ කලකිරීමක් තියෙනවද?" සුමන සැකයෙන් ප්‍රශ්න කළේය. "මේ විධියට මහ රජතුමාගේ සොහොනේ අළු නිවෙන්නත් ඉස්සරින් අයිය මලෝ





යුද්ධ කරගන්න ගියාම රට වැසියා කලකිරෙන්නේ නැද්ද?" ථේරපුත්තාභය ශෝකයෙන් තෙපළේ ය.

"අපි රට වැසියන් අතරට යමු. ඔවුන් එක්සත් කර ගැනීම කළ යුතුම දෙයක්" නන්දිමිත්‍ර ථේරපුත්තාභයගේ බසින් කැලඹී ගිය යහළුවන් අමතා, "පමා විය යුතු නෑ, අපි අපේ යුතුකම ඉෂ්ට කරමු. මහ රජතුමා වෙනුවෙන්, අපේ රට වෙනුවෙන් ජනතාව එක්සත් කරමු, භේද වීම වළක්වමු." යි කීය.

සියලු දෙනාම නන්දිමිත්‍රගේ ඉල්ලීමට එකඟ වූහ.

දෙසොහොයුරන් අතර යුදගනාවේදී කැරුණු මුල්ම සටනින් ගැමුණු රජතුමා පරාජයට පත්වී පලා ගියේ ය. දෙවැනි වරට විශාල සේනාවක් කැටුව විත් උපායයෙන් තිස්ස කුමරු පරාජයට පත් කොට මෑණියන් හා කඩොල් ඇතා ද ගෙන මාගම් පුරය බලා පිටත් විය. තිස්ස කුමාරයා අසල වූ විහාරයකට වැදී සැඟවී ගත්තේ ය.

දින කිහිපයකට පසු භික්ෂූන් වහන්සේලා එකතුව සොහොයුරන් සමඟි කැරවූහ. ඔවුහු එකිනෙකා බදා වැලඳ ගෙන සිය පියාණන් වහන්සේගේ නාමයෙන් සදහට ම සමඟියෙන් ජීවත් වන්නට ගිවිස ගත්හ.

sinhalaebooks.com

# 5

දුටුගැමුණු රජු දස මහා යෝධයන් කැඳවා "දැන් එළාර රජු මරා දමා රට එක්සත් කිරීමට කාලය පැමිණ තිබේ. කිමෙක්ද? තොපගේ සේනා සටනට සූදානම් දැ"යි ඇසූහ. "එසේය මහ රජතුමෙනි, හෙට නොව අදම සටන් අරඹමු"යි නන්දිමිත්‍ර පිළිතුරු දුන්නේය. හැම යෝධයෝම නන්දිමිත්‍රගේ අදහස අනුමත කළහ.

දුටුගැමුණු රජ්ජුරුවෝ මෑණියන්ගේ උපදෙස් අනුව තිස්සමහාරාමයට ගොස් භික්ෂූන් වහන්සේ වැඳ නමස්කාර කොට "රට එක්සත් කිරීම පිණිසත්, සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිසත් එළාර රජු හා සටන් කරනු පිණිස මහවැලි ගඟෙන් එතෙර බලා යන්නෙමි. අපට වැඳ දන් දී ගන්නා ලෙස භික්ෂූන් වහන්සේලා පන්සිය නමක් දෙවා වදාළ මැනැව" යි අයැද සිටියහ. මහා සංඝයා වහන්සේ ද මෙයට එකඟ වූහ.



පසු දා සියලු සේනා රැස් කොට දුටුගැමුණු රජු ඔවුන් අමතා දේශනයක් කළහ. "දේශප්‍රේමී සිංහල කොල්ලෙනි, ජීවිතය වතාගී තණ අග පිනි බිඳු වැනිය. එහෙත් අප ඉපදුණු රට, වහල්කොට තබා මැරෙන්නට සිදුවුවහොත් අපේ දරු මුණුබුරොත් අපට සාප කරනු ඇත. අප ඉපදුණු රට, ස්වර්ග රාජ්‍යයටත් වඩා ඉහළය. එහෙත් අනුරාධපුරය සොළීන් විසින් යටපත් කොට ගෙන ඇත්තේය. මේ සියල්ල ආරක්ෂා කොට රට රැක ගැනීමට අප සටන් කළ යුතුව තිබේ. එකම ලේ බිඳක් හෝ නොසොල්වා අනුරාධපුරය යටත් කොටගත හැකි නම් අප විසින් එය කළ යුතුය. අපේ පරමාර්ථය රට රැක ගැනීමත්, ශාසනයේ ශුභ සිද්ධියත් විනා අන් කිසිවෙක් නොවේ. සටන් බිමේ මුලින්ම සිටින සෙබළා මමය."

"වීර කොල්ලෙනි, මගේ ආදරණීය පියාණන් විජිතපුරයේ සිට අනුරාධපුරය දක්වා අත්පත් කරගන්නා අන්දමත්, එහි සිටින හිතවතුන්ගේ ලේඛනයක් සඳහන් කළ තඹ පතක් ඊයේ මම සොයා ගත්තෙමි. ඊයේ මා කිය වූ තඹ පත දෙස බැලූ විට මගේ පියාණන් වහන්සේ මොන තරම් දූරදර්ශී පුද්ගලයෙක් ද යන්න සිතා ගත හැකි විය. මගේ පියාණන්ගේ සිහිනය මම සැබෑ කරන්නෙමි. මේ මගේ රට, ඔබේ රට,

sinhaladebooks.com



ඔබ අප සියලු දෙනාගේම රට එක්සත් කිරීමට, ඒකීය රාජ්‍යයක් කිරීමට කරන යුද්ධයකි. අපේ ආගම ආරක්‍ෂා කරගැනීමට කරන යුද්ධයකි. අනාගතයේ මේ රටේ පහළවන සෑම සිංහලයකුටම නිවහල්ව, නිදහස්ව ජීවත් වන්නට ස්වාධීන ස්වෛරී රාජ්‍යයක් බිහි කරන්නට කරන සටනකි. තමන්ගේ ජීවිත ගැන නොතකා සටන් බිමට පැමිණ සිටින සියලුම සිංහලයනට මම අවංකව ම ගෞරව කරමි. ඔබට ජය වේවා! අපේ සටන ජයග්‍රාහී සටනක් වේවා!"

දුටුගැමුණු රජුගේ දේශනය අවසන්වත්ම දස දෙසින් කන් බිහිරි කරවන තරමට අත්පොළසන් හඬ ද, කස හඬ ද ඇසෙන්නට විය.



## 6

චතුරංගනී සේනාවන්ගෙන් ද, කඩු, පලිහ, කළහ, පත්තිරම්, අසිසත්ති, තෝමර, හොන්ඩාවල, චන්ද්‍රවතාදි ආයුධ පිරුවූ රථයන්ගෙන් ද, යුක්ත වූ හමුදාව මාගම සිට බුත්තල දක්වා අතුරු සිදුරු නැතිව සිටගත්හ. සී සාමින් සිටි ගොවින් අතර වූ තරුණයෝ ද දිවැවිත් හමුදාවට එක්වූහ. මාගම්පුර එකම ගෙදරක හෝ තරුණයකු සොයා ගැනීමට නොහැකි තරම් විය. සකලවිධ සේනාවම දේශභක්තියෙන්, දේශානුරාගයෙන් ඇළලී ගිය තරුණයෝම වූහ.

විහාරමහා දේවිය විශේෂ යානාවකින් පෙරමුණේ ගමන් කළාය. දුටුගැමුණු සෑම කරුණක් සඳහාම උපදෙස් ගන්නා ලද්දේ මෑණියන්ගෙනි. තම පියාගේ අනාගත සටන් සැලැස්ම පිළිබඳ අවබෝධයක් ලබා තිබුණේ මෑණියන් විසින් බව දුටුගැමුණු රජු මැනවින් දැන සිටියේ ය. එපමණ කුඩා

sinhalaebooks.com



නොව ජනතාව අතරද පියාණන් හැරුණු විට ජනප්‍රිය භාවයක් තිබුණේ තම මෑණියන්ට බව රජතුමා ප්‍රත්‍යක්ෂ කරගෙන තිබිණි. භික්ෂූන් වහන්සේද විහාරමහා දේවියට කිසි දිනෙක පිටු නොපෑහ. ඕ හැම දිනෙකම භික්ෂූන් වහන්සේලාට අවශ්‍ය කුදු මහත් හැම දෙයක් ම සොයා බලා සපයා දුන්නාය. එහෙයින් මෑණියන් යුද පෙරමුණේ ගමන් කිරීම මෙන්ම, ඇගේ උපදෙස් ලබා ගැන්ම ද දුටුගැමුණු රජුට මහත් අස්වැසිල්ලක් වූයේය.

ගිරිගම, නියමුල්ල, මැදගම, උයන්තොට, කුහම්කසපිටිය ආදී තැන්හී සේනාව රෑ කාලය ගත කළහ. ඒ හැම රැයකම ගැටබෙර, පනාබෙර, එකැස්බෙර, මිහිගු බෙර, මද්දල, පටහ, ලොහොබෙර, තලප්පර, වීරන්දම්, තම්මැට්ට, නියාන, රණරංග ඝෝෂා, සමුදු ඝෝෂා ආදී සිය දහස් ගණන් භේරී තූර්ය භාණ්ඩයක් එක් පැහැර ගස්වමින් රන්සක්, රිදී සක්, රුවන් සක්, රන් සිත්තම, රිදී සිත්තම, රන්දාරා, දළදාරා, දළහං, ලෝහං විජයද්වනි, ඔත්තු තත්තිරි, පටසිරිවිල් ආදී කාහල ජාතීන් ද එක් පැහැර පුම්බමින් මහා ප්‍රීතිඝෝෂා කරමින් අවට පෙදෙස්වල ජනයා ද දේශානුරාගයෙන් කුපිත කරවූහ. යුද්ධ සේනාව ලැගුම් ගත් සෑම පෙදෙසකින්ම සිය





ගණන් තරුණයෝ අතට අසු වූ මොනයම් හෝ ආයුධයක් ගෙන සේනාවට එක් වූහ. මෙ අන්දමින් දස දහස් ගණනින් මාගමින් පිටත් වූ යුද්ධ හමුදාව අතරමගදී ලක්ෂ ගණනින් එකතු වූ මහා සෙනඟ ද පිරිවරා ගෙන මියුගුණයට වන්හ. ගැමුණු රජතුමා අලුතින් එකතු වූ යුද පුහුණුව නො ලද තරුණයන් සමහරකු රාජකීය වෛද්‍ය හමුදාවට භාර කොට ඔවුන්ට වෙද පුහුණුවක් ලබා දෙන්නට අවශ්‍ය කටයුතු පිළියෙල කළහ. තවත් තරුණ පිරිසකට අවි ආයුධ රැක ගන්නට භාර කළහ. තවත් තරුණ කණ්ඩායමක් හමුදාවට භෝජන පිසීම භාරව සිටි අරක්කැමියනට සහයට භාර කළහ.

මියුගුණයේ දී එහි බලකොටුව අල්ලා ගැනීම ඉතා පහසුවෙන් කළ හැකි වූයේ මියුගුණය වටා සිටි සිංහල ජනතාව බලකොටුව ඇතුළතින් ද මාගම් පුරයෙන් ආ යුද්ධ සේනාව පිටතින් ද පහර දීම ආරම්භ කළ හෙයිනි. මෙහි දී මරණයට පත් වූයේ අතලොස්සක් පමණ වූ ද්‍රවිඩ පිරිසකි. මියුගුණය ජය ගැනීමෙන් පසු යුද්ධ සේනාව කාහල නාද පවත්වමින් කෑම බීම ආදියෙන් සප්පායම් වෙමින් කෙළි සෙල්ලමින් දෙතුන් දිනක් ම එහි විවේක සුවයෙන් ගත කළහ.

sinhalaebooks.com

## 7

විජිතපුර සටනින් නිසැකවම ජය ලැබෙන බව ගැමුණු හමුදාවේ සෑම භටයකුගේම විශ්වාසය වී තිබිණි. කොටුව ඇතුළත තිබූ යුද්ධායුධ ද විශාල සේනාවක්ද සමග අභිමාන නමැති නියෝජ්‍ය සෙන්පතියා ගැමුණු සේනාවට එක් වූ ආරංචිය ලැව් ගින්නක් මෙන් භටයන් අතර පැතිර ගියේය. බලකොටුව තුළද අභිමාන නමැති සිංහල සෙන්පතියාට පක්ෂ විශාල සේනාවක් සිටින හෙයින් ඔවුන්ගේ ආධාරය සහ අනුබලය නියම අවස්ථාවේ දී ලැබෙන හෙයින් එක් දිනෙකින් විජිතපුර බලකොටුව තමන් අතට ගැන්මට ගැමුණු රජුගේ හමුදාව තරයේ අධිෂ්ඨාන කරගෙන තිබිණ. හැම භටයෙක් ම කතා කළේ අවසන් මොහොතේ අභිමාන සෙනෙවියා කළ පෙරළිය ගැනය.

සේනාංක භාර සෙනෙවියෝද කවරදාවත් නො පැවැති අන්දමේ උද්‍යෝගයකින් කටයුතු කරනු පෙනිණ. සෑම භටයෙක්ම දේශවාත්සල්‍යයෙන් ඔද ගැන්වීමට සෙනෙවිවරු සමත් වූහ.

විජිතපුර බලකොටුවේ ප්‍රධාන දොරටුව බිඳ හෙළීම නන්දිමිත්‍ර ප්‍රමුඛ සේනාංකයට භාර කොට තිබිණි. ඒ සේනාංකය දස දහසක් පමණ තරුණ භටයන්ගෙන් ද, කඩොල් ඇතා පිරිවර කොට ගත් ඇත් සේනාවකින් ද සමන්විත වූයේය.

බලකොටුව තුන් පැත්තෙකින් වට කරන ලද්දේය. රහස් දොරටුව දන සිටියේ අභිමාන හෙයින් ඔහු බලකොටුව තුළින් ගෙන ආ පන්සියයක් පමණ යුද භටයනට අමතරව තවත් පන්දහස් පමණ වූ හමුදා සේනාංකයක්ද ඔහු යටතට පත් කොට සේනා මෙහෙයවීම සඳහා උප සෙනෙවියන් ගණනාවකගේ සහයෝගය ද ලබාදී තිබිණ.

සටනට දින ගණනාවක් තිස්සේ සූදානම්ව සිටි ගැමුණු සේනාවත්, එබඳු සූදානමෙකින් නොසිටි එළාරගේ සේනාවත්, ඔවුනොවුන් මුණ නොගැසීම සටන ආරම්භ වුව ද කොටුව තුළට එල්ලය බලා ගී සැර යවන ලද්දේ ගැමුණු හමුදාවේ පළපුරුදු හී යවන්නන් විසිනි. මේ සඳහා හෝරා ගණනකට කලින් අට්ටාල ඉදිකළ හෙයින් ඒ අට්ටාලයක් මත නැඟී හරියට ම එල්ලයට හී විදින්නට ගැමුණු භටයෝ සමත් වූහ. එන පොට හොඳ නැති හෙයින් බලකොටුව තුළ වූ එළාර භටයෝ

කොටු පවුර උඩට නැඟී ගැමුණු භටයන්ට හී සැරවලින් පිළිතුරු දුන්හ. තමන්ට වූයේ බලවත් වාසියකැයි කියමින් පවුර මතට නැඟ ගත් භටයන් හිස මතට මේ පැත්තේ සිට නොකඩවා හී වරුසා වස්වන්නට පටන් ගැනිණ. පවුර මත නැඟ ගත් භට පිරිස ක්‍රම ක්‍රමයෙන් පසු බසිනු පෙනිණ. එහෙත් ගැමුණු සේනාව අට්ටාල මත සිට දිගටම එල්ලය බලා හී යැවූහ.

නන්දිමිත්‍රගේ සේනාව ප්‍රධාන කොටු දොරටුව බිඳ හෙළන්නට ගත් පරිශ්‍රමය විශාලය. එයට විරුද්ධව එළාරගේ සේනාව කොටු පවුර මතට නැඟී වරින් වර ප්‍රති ප්‍රහාර එල්ල කළහ. ඇතුන් මත රත් කළ ලෝදිය ද වත් කළහ. එහෙත් ඇතුන් මී හරක් හමින් කළ ඇඟලුම්න් සැරසී සිටි හෙයින් මේ උත්සාහය ව්‍යර්ථ විය. ඇත් සේනාව හෙම්බත් වී සිටි නමුත් නන්දිමිත්‍ර කඩොල් ඇතාට රා පොවා යහළුවකුගේ මෙන් හිස අත ගා පෙරමුණටම යැව්වේය. අනෙක් ඇත් ගොවුවන්ද තම තමනට භාර ඇතුනට රා පොවා වඩ - වඩාත් දිරි ගැන්වූහ. ඇතුන්ගේ කුංචනාදයෙන් යුද පිටිය කැලඹී ගියේ ය. කඩොල් ඇතා සිය දළින් ඇන කොටු දොර බිඳින්නට උත්සාහ කළේය. ඔහු අනුගමනය කරමින් අනෙක් ඇතුන් ද කොටු දොරටු මුළු බර යොදා පහර දෙන්නට පටන් ගත්හ. මේ අතර කොටුව තුළ මහා දෝංකාරයක් ඇසෙන්නට විය. මරණ



වේදනාවෙන් කෙඳිරිගාන්නන්ගේද ජයෙන් මත්වී ඔල්වරසන් නඟන්නන්ගේද ඝෝෂාව ගැමුණු සේනාවට පුදුමයක් විය.

රහස් දොරටුවෙන් ඇතුළු වූ සේනාව කොටුව තුළට පිවිස ඇති බවත්, දෙසෙනඟ මුහුණට මුහුණලා සටන් කරන බවටත් ලැබුණු ආරංචිය ලැව් ගින්නක් මෙන් පැතිර ගියේය. බොහෝ සෙනෙවිවරු තම සේනාංකයන්ට රහස් දොරටුවෙන් ඇතුළු වන්නට අණ දුන්හ. එහෙයින් විජිතපුර බලකොටුව ගැමුණු සේනාවන්ගෙන් පිරී ගත්තේය. මේ වන විට කඩොල් ඇතා ද ප්‍රධාන කොටු දොර බිඳින ලද හෙයින් එමගින්ද ඉතිරි සේනාවනට ඇතුළට වදින්නට අවස්ථාව ලැබිණ.

කොටුව ඇතුළත මුහුණට මුහුණලා කෙරුණු සටන්වලින් එළාර හමුදාවට අයත් වූයේ පරාජයයි. ඔවුහු ආයුධ ශක්තියෙන් මෙන්ම, ආත්ම ශක්තියෙන් ද පිරිහී සිටියහ. මරණය වැලඳ ගන්නට අකැමැති සෙනඟ පරාජය පිළිගෙන පසු බැස්සහ. ඔවුන් අනුරාධපුරය තෙක් ලුහුබඳින්නට තරම් ඇතැම් ගැමුණු සේනාංක එඩිතර වූහ. සවස් වන විට විජිතපුරය සම්පූර්ණයෙන්ම ගැමුණු රජුට අයත් වූ බව පෙනිණ. යටත් වූ සේනාවන්ට හොඳින් සංග්‍රහ කිරීමට ගැමුණු රජු නියෝග කළ බව අණබෙරකරුවන් විසින් බලකොටුව පුරාම පතළ කරන ලදී.

sinhalaebooks.com

## 8

විජිතපුර බලකොටුව ජයග්‍රහණය කිරීමෙන් පසු දෙසතියක්ම හමුදාවනට විවේක ගැනීමටත්, ජයපැන් බොන්නටත් ඉඩකඩ සලසා දෙන ලදී. එහෙත් මොනයම් හේතුවක් නිසා හෝ කිසිම පුරවැසියකුට හිංසා, පීඩා කිරීම, දේපළ කොල්ලකෑම, දේපළවලට හානි කිරීම ආදිය සම්පූර්ණයෙන් තහනම් කොට තිබුණා පමණක් නොව එවැනි ක්‍රියාවකට වරදකරුවන්නකුට මරණ දණ්ඩනය ද නියම කෙරෙන බව අණබෙරකරුවෝ නිරන්තරයෙන් මතක් කර දුන්හ.

දිනපතා රැස්වන රාජ සභාව අනුරාධපුර සටනට අවශ්‍ය විධි විධාන සාකච්ඡා කරමින් තමන්ගේ මුළු ශක්තියම අනුරාධපුරය යටත් කර ගැනීමට යෙදිය යුතු යැයි තීරණය කරගෙන තිබිණ. භටයන් ජය පැන් බොමින් කාලය ගත කළ අතර යුද්ධායුධ නිපදවීමේ නියුක්ත කම්මල්කරුවෝ දිවා රෑ දෙකෙහිම යුද්ධායුධ නිෂ්පාදනයෙහි නියුක්ත වූහ.



දෙසතියක්ම ඉක්ම ගියේ නොදැනීමය. ජ්‍යෝතිෂඥයන් විසින් පිළියෙල කරන ලද සුබ මොහොතෙකින් අනුරාධපුර සටන සඳහා ලක්ෂ සංඛ්‍යාත මහා සේනාව පිටත් වූයේ කෙළි සෙල්ලම්න් හා පංච තූර්ය නාදයන්ගෙන් යුක්තව ය. අසන්නන් මෙන්ම දකින්නන් තුළ විස්මයත්, භීතියත්, කුතුහලයත් ඇති කිරීමට මෙය හේතුවක් විය. දුටුගැමුණු රජතුමා මහා සේනාවේ ඉදිරියෙන්ම යෑම සිංහල සේනාවේ ධෛර්යය තව තවත් දියුණු කළේය. අනුරාධපුර රාජධානිය තෙක් ගමන් කළ සේනාව මොනයම් අන්දමේ හෝ විරෝධයක් නැතිවම නගර සීමාවට ළංව කඳවුරු බැඳ ගන්නා ලදී. පසුව දා සටන සඳහා සූදානම් වන්නැයි එළාර රජුට තල් පතක් මඟින් දන්වා හරින ලදී. තමන් සටනට සූදානම් බව එළාර රජු විසින් ද දන්වන ලද්දේය. එම දින රාත්‍රියද මහා සේනාව ප්‍රීති ඝෝෂා කරමින් නානාවිධ බෙර වාදනය කරමින් ද කෙළි දෙළෙන් පසු කළහ. එහෙත් දුටුගැමුණු රජතුමා මුළු රැයම නිදි වර්ජිතව ගත කළේ ය. ඔහු අසල වූයේ නන්දිමිත්‍ර හා අභිමාන පමණකි. මෙබඳු මහා සංග්‍රාමයකින් ජීවිත දස දහස් ගණනක් විනාශ වන බවත්, එබඳු පාප කර්මයකට මුහුණ දෙන්නට සිය අකැමැත්තත් ඔහුගේ මුවින් වරින් වර පිට විය.

sinhalaebooks.com



"මහ රජතුමනි, මිනිසුන් නොමැරී යුද්ධයක් කරන්නට බැහැ. අපේ සෙනඟ මෙන්ම ඔවුන්ගේ සෙනඟත් යුද්ධය නිසා මරණයට පත් වෙනවාට සැකයක් නෑ."

"ඒක තමයි නන්දිමිත්‍ර, මිනිසුන් මැරීම නොව මිනිසුන් ජීවත් කරවීමටයි, මට වුවමනා කරන්නේ."

රජතුමා නොමනාපයෙන් මෙන් නන්දිමිත්‍රගේ මුහුණ දෙස බලා සිටියහ.

"ඔවුන් අපට නිකම්ම යටත් වෙන්නේ නෑ."

"ඉතින් අපි යුද්ධ නොකර කොහොමද රට එක්සත් කරන්නේ?"

නන්දිමිත්‍ර සෙමින් වුවද ස්ථිරසාර ස්වරයෙන් ප්‍රශ්න කළේය.

"ඔව් නන්දි, ඒක මම මෙන්න මේ විදියට හිතුවා. එළාරට ආරාධනා කරන්න මාත් එක්ක ද්වන්ද්‍ව සටනකට එන්න කියලා. එහෙම වුණොත් අපි දෙන්නගෙන් එක් කෙනෙක් මැරෙයි. මිනිසුන් දහස් ගණනකගේ ජීවිත බිලි දෙන්නට වෙන්නේ නෑ."

රජතුමා නන්දිමිත්‍රගේ හා අභිමානගේ මුහුණ දෙස වරින් වර බලන්නට වූහ.

"ඔබ වහන්සේට තුනුරුවන්ගේ සරණයි" අභිමාන කීය.

"එළාර එයට අකැමැති වුණොත්?"





"නෑ මම හිතන්නේ නෑ, ඔහුත් ධර්මිෂ්ඨ රජෙක්. මිනිසුන් මැරෙනවා දකින්නට එළාර රජුත් කැමති වෙන්නේ නෑ."

"එහෙම නම් ඔබ වහන්සේට නිසැකවම ජයග්‍රහණය ලැබෙනවා" අභිමාන කීය.

දුටුගැමුණු රජතුමා විසින් එළාර රජු වෙත තල් පතක් යවන ලද බවත්, දෙ රජුන් අතර පවත්නා සටනකින් ජය පරාජය තීරණය කරන්නට නියම කරගත් බවත් යන ආරංචිය ලැව් ගින්නක් මෙන් සේනාව අතර පැතිර ගියේය. එළාර රජු ද දුටුගැමුණු රජුගේ යෝජනාවට එකඟත්වය පළ කොට සේනා විනාශ වීමත් මිනිස් ඝාතනයක් තමන් පිළිකුල් කරන බව ද ඒ වෙනුවට තම ජීවිතය පූජා කරන්නට සූදානම් බව ද දන්වා එවන ලදහ.

එළාර රජුත්, දුටුගැමුණු රජුත් නියමිත වේලාවට ඔවුනොවුනට මුහුණ දුන්හ. දෙපිරිස අතර එකඟත්වයට පැමිණි අන්දමට එළාර රජු ඔහුගේ ආරක්ෂාවට සෙනෙවියන් දෙදෙනකු (ආයුධ රහිතව) පිරිවර කොට පැමිණියහ. දුටුගැමුණු රජතුමා යුද පිටියට පිවිසියේ තම ආරක්ෂාව සඳහා නන්දිමිත්‍ර හා අභිමාන කැටුවය.

අභිමාන දකින්ම එළාර රජුගේ මුහුණ වියැළී ගියේ ය. විජිතපුර සටන පාවා දෙන ලද්දේ

sinhalaebooks.com



අභිමාන බව සොළී සේනාවට නොරහසක් විය. එය වඩාත් හොඳින් දැන සිටියේ එළාර රජුය.

පර්වතයක් වැනි විශාල සිරුරක් ඇති පර්වත ඇතා පිට නැගී සිටි එළාර රජු තරුණයෙකු මෙන් එඩිතර වූහ. කඩොල් ඇතා පිට නැගී දුටුගැමුණු රජු උණුසුම් බලාපොරොත්තු සහිතව තම ප්‍රතිවාදියාට මුහුණ දුන්නේය. දෙ රජුන් ඔවුනොවුන්ට ආචාර කොට සටන ආරම්භ කළහ.

බොහෝ වේලාවක් ජය පරාජය නිශ්චය කළ නොහැකි අන්දමින් දෙදෙනාම අභීතව සටන් කරන ආකාරය දෙසෙනඟටම පුදුමයක් විය. මේ අතර එළාර රජුගේ ප්‍රමාදයක් බලා දුටුගැමුණු රජු එල්ල කළ හෙල්ල පහර එළාර රජුගේ පපුව විනිවිද ගියේය. ඔහු ලේ පෙරාගෙන පර්වත ඇතා පිටින් වැටුණි. ගැමුණු රජු ඉදිරියට පැන එළාර රජු දෙඅතින් ඔසොවාගෙන බිමට ගති. පියෙකු විසින් ආදරණීය පුතකු වඩාගෙන යන්නාක් මෙන් එළාර රජු ඔසොවා ගෙන සෙවණකට ගිය ගැමුණු රජු ඔහුට වහා පැන් පොවා තම අතින්ම සාත්තු සප්පායම් කරන්නට විය.

මඳක් ඇස් විවර කළ එළාර රජු දුටුගැමුණු රජුගේ අතින් අල්ලාගෙන මෙසේ කීය. "මම තව මොහොතෙකින් මැරෙන බව සහතිකයි.





ඒත් පුතා, මේ රට එක්සත් කරන්නට ඔබේ පියාත්, ඔබත් ගත් උත්සාහය ගැන මම සතුටුයි."

"පියාණෙනි, ඔබ වෙනුවෙන් මා කුමක් කළ යුතුද?"

"මා වෙනුවෙන් පුතා, උඹට කරන්නට පුළුවන් එක උදව්වයි."

"මොකක් ද පියාණෙනි, ඒ උදව්ව? මම නොවැරදීම කරන්නම්"

"මට ඉන්නෙ එකම දරුවයි. ඕ තරුණියක්. ඇගේ නම රජිතා. ඔබ රජිතා විවාහ කරගන්නවා නම් මට කරන්නට පුළුවන් ලොකුම උදව්ව එයයි. පියාණෙනි, ඒ උදව්ව මම නොවැරදීම කරන්නම්."

එළාරරජුමඳක්මුවවිවරකොටසිනාසීඅවසන් හුස්ම හෙළූහ. එළාර රජුගේ අවසන් කටයුතු ඉතාම ගෞරවාකාරයෙන් ඉෂ්ට කළ දුටුගැමුණු රජතුමා ඔහුගේ අළු නිදන් කොට චෛත්‍යක් ද ඉදි කළේ ය. එම ස්ථානය පසු කොට යන ලොකු කුඩා සැම පුද්ගලයෙක්ම අසුන් පිටින් හෝ දෝලාවන්ගෙන් බැස, හිස් වැසුම් මුදා එම චෛත්‍යයට ගෞරව කළ යුතුය යනුවෙන් රාජ ආඥාවක් ද පැන විය.

මුළු තුන් හෙළයට ම අග රජ බවට පැමිණි දුටුගැමුණු රජතුමා ජනතාව අමතා දීර්ඝ

sinhalaebooks.com



දේශනයක් කළේය. "රට එක්සත් කිරීම සඳහා මගේ පියාණන් තුළ පැවති අභිලාෂය මා සම්පූර්ණයෙන් ඉෂ්ට කළා. මගේ පියා මෙන් මමත් ජාතිභේද, කුලභේද, ගෝත්‍රභේද වලට තදින්ම විරුද්ධයි. අප හැමකෙනෙකුටම එක හා සමානව සහෝදර ප්‍රේමයෙන්, මෛත්‍රියෙන් සලකන්නට ඕනෑ. දෙමළාත් බෞද්ධ සිද්ධස්ථාන විනාශ කළ බව ඇත්ත. ඒත් ඒ හිලවුවට අප ඔවුන්ගේ සිද්ධස්ථාන විනාශ කරන්නේ නෑ. ඔවුනට හිරිහැර කරන්නේ නෑ. අපි බෞද්ධයෝ. කුඩා හැම ජාතියකට ම අප ආරක්ෂාව සලසා දෙන්නට ඕනෑ. මගේ රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව මහා ජාතිය, කුඩා ජාතිය, කියල මොනයම් අන්දමේ හෝ වෙනස්කමක් නෑ. සියලු දෙනාම සමඟියෙන් ජීවත් කරවීමයි මගේ ප්‍රතිපත්තිය. කිසිවෙකුට ඇන කොටා ගන්නට මා ඉඩ දෙන්නේ නෑ. අද සිටම මගේ සෙනෙවිවරු රට පුරා සමඟිය තහවුරු කරවීමට අවශ්‍ය පියවර ගන්නවා ඇති. මේ රට නැවත වරක් කෑලි කෑලිවලට කඩා පාලනය කරන්නට ඉර හඳ පවත්නා තුරු අවස්ථාවක් නොදිය යුතුයි."

ප්‍රීති ඝෝෂා ද නානාවිධ තූර්ය වාදනයන්ද රජුගේ දේශනය අවසන්වත්ම ඇසෙන්නට විය.

sinhalaebooks.com

"මගේ රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව
මහ ජාතිය සුළු ජාතිය කියලා
මොනයම් අන්දමේ හෝ
වෙනස් කමක් නෑ.
සියලු දෙනාම
සමගියෙන් ජීවත් කරවීමයි
මගේ ප්‍රතිපත්තිය.
කිසිවකුට ඇඟ කොටා ගන්නට
මා ඉඩ දෙන්නේ නෑ."

දුටුගැමුණු රජතුමා

ISBN 955-21-
60166458-2
Rs. 120.00

Buy online www.mdgunasena.com
Find us on Facebook
iRead Call 0774 447 227, we now deliver to your doorstep